(අන්තර්ජාල අනුවාදයකි.)

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1999 අංක 37 දරන නඩත්තු පනත

---

[සහතිකය සටහන් කළේ 1999 ඔක්තෝබර් මස 22 වැනි දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1999 ඔක්තෝබර් මස 22 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 12.50** **තැපැල් ගාස්තුව : රු. 5.25**

[සහතිකය සටහන් කළේ 1999 ඔක්තෝබර් මස 22 වැනි දින]

එල්. ඩී.—ඕ. 35/98.

**තම නඩත්තුව තමන් විසින්ම කරගනු නොලැබිය හැකි ළමයින්, වියපත් දරුවන්, ආබාධිත දරුවන් සහ කලත්‍රයන් නඩත්තු කිරීම සඳහා ද ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියේ විධිවිධානවලට හා නඩත්තු කිරීමට අදාළ නීතියට අනුකූලව ක්‍රියා කිරීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1999 අංක 37 දරන නඩත්තු පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

I වන කොටස

නඩත්තු සඳහා ඉල්ලුම් කිරීම

කලත්‍රයකු හෝ ළමයකු හෝ වියපත් දරුවකු හෝ ආබාධිත දරුවකු හෝ නඩත්තු කිරීම සඳහා වූ ආඥාව.

**2.** (1) තමාටම තම නඩත්තුව කරගෙන යා නොහැකි තම කලත්‍රයකු නඩත්තු කිරීම, ප්‍රමාණවත් වත්කමක් ඇති යම් තැනැත්තකු හෝ තැනැත්තියක හෝ විසින් නොසලකා හරින හෝ අයුක්ති සහගත ලෙස ප්‍රතික්ෂේප කරන හෝ අවස්ථාවක දී, නඩත්තු සඳහා වූ ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබ එවැනි නොසලකා හැරීමක් හෝ අයුක්ති සහගත ප්‍රතික්ෂේප කිරීමක් හෝ ඔප්පු කරනු ලැබූ විට, ඒ තැනැත්තාගේ හෝ තැනැත්තියගේ හෝ ආදායම ද, ඒ කලත්‍රයාගේ වත්කම් හා අවස්ථානුගත කරුණු ද සැලකිල්ලට ගනිමින්, ඒ කලත්‍රයා නඩත්තු කිරීම සඳහා සුදුසු යයි මහෙස්ත්‍රාත්වරයා විසින් සළකනු ලබන යම් මාසික අනුපාතිකයක් අනුව මාසික දීමනාවක් දිය යුතු යයි මහෙස්ත්‍රාත්වරයා විසින් හෝ ඒ තැනැත්තාට හෝ තැනැත්තියට හෝ ආඥා කරනු ලැබිය හැකි ය :

එසේ වුවද, ඉල්ලීම කරන කලත්‍රයා අනාචාරයේ ජීවත් වන්නකු වේ නම් හෝ කලත්‍රයන් දෙදෙනා ම අන්‍යොන්‍ය කැමැත්තෙන් එකිනෙකාගෙන් වෙන් වී ජීවත් වන්නේ නම්, යට කී අන්දමේ ආඥාවක් කරනු නොලැබිය යුතු ය.

(2) තමාටම තමා නඩත්තු කරගත නොහැකි ළමයකු නඩත්තු කිරීම, ප්‍රමාණවත් වත්කමක් ඇති මව්පියන්ගෙන් කෙනෙකු විසින් නොසලකා හරිනු ලබන හෝ ප්‍රතික්ෂේප කරනු ලබන හෝ

අවස්ථාවක දී, නඩත්තු සඳහා වූ ඉල්ලීමක් මත හා ඒ නොසලකා හැරීම හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ ඔප්පු කරනු ලැබූ විට, ඒ මව්පියන්ගේ ආදායම සහ ළමයාගේ වත්කම් හා අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගනිමින්, මහෙස්ත්‍රාත්වරයා විසින් සුදුසු යයි සලකනු ලබන යම් මාසික අනුපාතිකයක් අනුව ඒ ළමයා නඩත්තු කිරීම සඳහා මාසික දීමනාවක් දිය යුතු යයි මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ මව්පියන්ට ආඥා කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද, විවාහයකින් නූපන් ළමයකු සම්බන්ධයෙන් වන විටෙක, මහෙස්ත්‍රාත්වරයා සෑහීමට පත්වන පරිදි ප්‍රබල සාක්ෂි මගින් මව්පියභාවය තහවුරු කරනු ලබන්නේ නම් මිස, එවැනි ආඥාවක් කරනු නොලැබිය යුතු ය.

(3) තමාටම තමා නඩත්තු කරගත නොහැකි වියපත් දරුවකු නඩත්තු කිරීම, ප්‍රමාණවත් වත්කමක් ඇති මව්පියන්ගෙන් කෙනෙකු විසින් නොසලකා හරින හෝ ප්‍රතික්ෂේප කරන හෝ අවස්ථාවක දී, නඩත්තු සඳහා වූ ඉල්ලීමක් මත සහ ඒ නොසලකා හැරීම හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ ඔප්පු කරනු ලැබූ විට, ඒ මව්පියන්ගේ ආදායම සහ ඒ වියපත් දරුවාගේ වත්කම් හා අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගනිමින්, මහෙස්ත්‍රාත්වරයා විසින් සුදුසු යයි සළකනු ලබන යම් මාසික අනුපාතිකයක් අනුව ඒ වියපත් දරුවා නඩත්තු කිරීම සඳහා මාසික දීමනාවක් දිය යුතු යයි මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ මවට හෝ පියාට ආඥා කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද, විවාහයකින් නූපන් වියපත් දරුවකු සම්බන්ධයෙන් වන විටක, මහෙස්ත්‍රාත්වරයා සෑහීමට පත්වන පරිදි, ප්‍රබල සාක්ෂි මගින් මව්පියභාවය තහවුරු කරනු ලබන්නේ නම් මිස, එවැනි ආඥාවක් කරනු නොලැබිය යුතු ය.

(4) තමාටම තමාගේ නඩත්තුව කරගත නොහැකි, ආබාධිත දරුවකු නඩත්තු කිරීම, ප්‍රමාණවත් වත්කමක් ඇති මව්පියන්ගෙන් කෙනකු විසින් නොසලකා හරින හෝ ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක , නඩත්තු සඳහා වූ ඉල්ලීමක් මත සහ ඒ නොසලකා හැරීම හෝ ප්‍රතික්ෂේප කිරීම ඔප්පු කරනු ලැබූ විට, මව්පියන්ගේ ආදායම සහ ඒ ආබාධිත දරුවාගේ වත්කම් හා අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගනිමින්, මහෙස්ත්‍රාත්වරයා විසින් සුදුසු යයි

සලකනු ලබන යම් මාසික අනුපාතිකයක් අනුව ඒ ආබාධිත දරුවා නඩත්තු කිරීම සඳහා මාසික දීමනාවක් දිය යුතු යයි මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ මවට හෝ පියාට ආඥා කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද, විවාහයකින් නූපන් ආබාධිත දරුවකු සම්බන්ධයෙන් වන විටක, මහෙස්ත්‍රාත්වරයා සෑහීමට පත්වන පරිදි ප්‍රබල සාක්ෂි මගින් මව්පියභාවය තහවුරු කරනු ලබන්නේ නම් මිස, එවැනි ආඥාවක් කරනු නොලැබිය යුතු ය.

(5) (1) වන හෝ (2) වන හෝ (3) වන හෝ (4) වන හෝ උපවගන්ති යටතේ කරන ලද ඉල්ලීමක් අනුව දීමනාවක් ගෙවීම සඳහා මහෙස්ත්‍රාත්වරයකු විසින් ආඥාවක් කරනු ලැබ ඇති අවස්ථාවක, වාර්තා කරනු ලැබිය යුතු මනා හේතූන් මත වෙනත් යම් දිනයක සිට ගෙවීම් කළ යුතු යයි මහෙස්ත්‍රාත්වරයා විසින් ආඥා කරනු ලැබ ඇත්නම් මිස, නඩත්තු සඳහා ඒ අධිකරණය වෙත ඉල්ලීම කරන ලද්දේ යම් දිනයක ද එ දින පටන් ඒ දීමනාව ගෙවනු ලැබිය යුතු ය.

(6) අවස්ථාවෝචිත පරිදි, යම් ළමයකු වියපත් දරුවකු හෝ ආබාධිත දරුවකු නඩත්තු කිරීම සඳහා වූ ඉල්ලීමක්, අවස්ථාවෝචිත පරිදි,(2) වන, (3) වන හෝ (4) වන උපවගන්ති යටතේ ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී අධිකරණය විසින්, පාර්ශවකරුවන්ගේ ඉල්ලීම මත හෝ අධිකරණයේ මෙහෙයවීමෙන් ම හෝ, ඒ මව්පිය දෙදෙනා අතුරෙන් අනෙක් තැනැත්තා ඒ ඉල්ලීමට පාර්ශවකරුවකු වශයෙන් එකතු කරනු ලැබිය හැකි අතර, ඒ මව්පිය දෙදෙනාගෙන් එක් තැනැත්තකුට හෝ ඔවුන් දෙදෙනාට ම හෝ විරුද්ධව උචිත වන පරිදි ආඥාවක් කරනු ලැබිය හැකි ය.

ආඥාව වලංගු වන කාලසීමාව.

3. මේ පනත යටතේ යම් ළමයකු, වියපත් දරුවකු හෝ ආබාධිත දරුවකු නඩත්තු කිරීම සඳහා වූ දීමනාවක් සම්බන්ධයෙන් කරන ලද යම් ආඥාවක් යටතේ කලින් අයවිය යුතුව තිබූ මුදල් අයකර ගැනීමේ කාර්යය සඳහා හැර, ඒ ආඥාව කරන ලද්දේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද අවස්ථාවෝචිත පරිදි, ඒ තැනැත්තා මේ පනතේ අර්ථානුකූල ළමයකු, වියපත් දරුවකු හෝ ආබාධිත දරුවකුව සිටීම නතර වීමෙන් පසු ඒ ආඥාව නිර්බල සහ අවලංගු වන්නේ ය.

නඩත්තු සඳහා වූ ඉල්ලීම්.

4. (1) නඩත්තු සඳහා වූ ඉල්ලීමක් –

(අ) යම් ළමයකුගේ හෝ ආබාධිත දරුවකුගේ හෝ නඩත්තු සඳහා ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක, ඒ ළමයා හෝ ආබාධිත දරුවා විසින් නැතහොත් ඒ ළමයාගේ හෝ ආබාධිත දරුවාගේ භාරකාරත්වය දරන තැනැත්තකු විසින් ; හෝ

(ආ) වියපත් දරුවකුගේ නඩත්තුව සඳහා ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක, ඒ වියපත් දරුවා විසින් ම හෝ ඒ ඉල්ලීම ඉදිරිපත් කිරීමට ඒ වියපත් දරුවාට නොහැකි වන විටක ඔහු හෝ ඇය හෝ වෙනුවෙන් කවර වුවද තැනැත්තකු විසින් ;

(ඇ) කලත්‍රයකු නඩත්තු කිරීම සඳහා වන අවස්ථාවක ඒ කලත්‍රයා විසින් ම හෝ ඒ ඉල්ලීම ඉදිරිපත් කිරීමට ඒ කලත්‍රයාට නොහැකි වන අවස්ථාවක ඔහු හෝ ඇය වෙනුවෙන් කවර වුව ද තැනැත්තකු විසින් ,

ඒ ඉල්ලීම ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) නඩත්තු සඳහා වූ ඉල්ලීමක්, එම ඉල්ලීම කරන ඉල්ලුම්කරු හෝ එම ඉල්ලීම කරන ලද්දේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද, ඒ තැනැත්තා හෝ එම ඉල්ලීම කරන ලද්දේ යම් තැනැත්තකුට එරෙහිව ද, එම තැනැත්තා හෝ වාසය කරන ප්‍රදේශය විෂයයෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

## II වන කොටස

### නඩත්තු සඳහා වූ ආඥාවක් බලාත්මක කිරීම

ආඥා බලාත්මක කිරීම.

5. (1) 2 වන වගන්තිය හෝ 11 වන (1) වන වගන්තියේ අතුරු විධානය හෝ යටතේ යම් තැනැත්තකුට (මෙහි මින් මතු "වගඋත්තරකරු" යනුවෙන් සඳහන් කරනු ලබන) විරුද්ධව ආඥාවක් කර ඇති අවස්ථාවක දී ඒ ආඥාවට අනුකූලව කටයුතු කිරීම ඒ තැනැත්තා විසින් නොසලකා හැර ඇති විටක, ඒ ආඥාව කඩකරන සෑම විටක දී ම, ගෙවීම පැහැර හැර ඇති එක් එක් මාසයේ සම්පූර්ණ දීමනාව හෝ ඉන් යම්

කොටසක් හෝ වෙනුවෙන්, එක් මාසයක් දක්වා දීර්ඝ කරනු ලැබිය හැකි කාලයකට බරපතල වැඩ ඇතිව හෝ ඒ නොමැතිව හෝ වග උත්තරකරු බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයකට 10 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව මහෙස්ත්‍රාත්වරයා විසින් නියම කරනු ලැබිය හැකි ය.

(2) නඩත්තු ආඥාවක් යටතේ වූ යම් ගෙවීමක් ලැබීමට හිමිකම ඇත්තා වූ යම් තැනැත්තකු විසින් ඒ සඳහා ඉල්ලීමක් කරනු ලැබ ඇත්නම්, මහෙස්ත්‍රාත්වරයා විසින්, වගඋත්තරකරු බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් කරනු ලැබීමට පෙර, මහෙස්ත්‍රාත් අධිකරණවල දී මහෙස්ත්‍රාත්වරයන් විසින් නියම කරනු ලබන දඩ අයකිරීම සඳහා නීති මගින් විධිවිධාන සලස්වා ඇති ආකාරයට, ගෙවීම පැහැර හරිනු ලැබ ඇති මුදල අයකර ගැනීම සඳහා විධාන කෙරෙන, වරෙන්තුවක් නිකුත් කරනු ලැබිය හැකි ය.

වගඋත්තරකරුගේ වැටුප් තහනම් කිරීම.

**6.** (1) නඩත්තු ආඥාවක් යටතේ යම් ගෙවීමක් ලැබීමට හිමිකම ඇත්තා වූ තැනැත්තකුගේ ඉල්ලීම මත, මාස දෙකක් ඉක්ම වූ කාලසීමාවක් සඳහා අයවිය යුතු නඩත්තු ගෙවීම වගඋත්තරකරු පැහැරහැර ඇතැයි මහෙස්ත්‍රාත්වරයාට පෙනීයන්නේ නම්, පරීක්ෂණයකින් පසුව, මහෙස්ත්‍රාත්වරයා විසින් (මෙහි මින් මතු "වැටුප තහනම් කිරීමේ ආඥාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ආඥාවක් මගින්, ඒ ආඥාවේ සඳහන් කරනු ලබන යම් කාලයක් සඳහා, ඒ ආඥාවේ සඳහන් කරනු ලබන යම් මුදලක් වගඋත්තරකරුගේ වැටුපෙන් අඩුකර, අධිකරණය විසින් විධාන කරනු ලබන ආකාරයට වහාම එව්ය යුතු යයි වගඋත්තරකරුගේ සේවායෝජක වශයෙන් මහෙස්ත්‍රාත්වරයාට පෙනීයන තැනැත්තකුට නියම කරනු ලැබිය හැකි ය.

(2) (අ) මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ආඥාවක් කිරීමට පෙරාතුව, ඒ උපවගන්ති යටතේ ආඥාවක් නොකළ යුත්තේ මන්ද යන බවට හේතු ඇතොත් දක්වන ලෙස සහ ඒ ආඥාවේ සඳහන් කරනු ලබන හැකි යම් කාලයක් ඇතුළත වගඋත්තරකරුගේ වැටුප් විස්තර සපයන ලෙස, ඒ ආඥාව භාරදිය යුතු යයි තමා අදහස් කරන තැනැත්තා වෙත, මහෙස්ත්‍රාත්වරයා විසින් දැනුම්දෙනු ලැබිය යුතු ය. මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කරන ලද යම් ආඥාවක් කවරේද යත්, ඒ ආඥාව මගින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද පළාත් බද

මහාධිකරණයක් වෙත කරනු ලබන අභියාචනයක එය විෂය කරුණක් විය හැකි ය. එහෙත් එවැනි අභියාචනයක් තිබුණේ වුවද, මහෙස්ත්‍රාත්වරයා විසින් මේ පනත යටතේ නීතිකෘත්‍ය පවත්වා ගෙන යාමට තීරණය කරනු ලැබිය හැකි ය. එවැනි සෑම අභියාචනයකටම සහ එය සම්බන්ධයෙන්, මේ පනතේ 14 වන වගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

(ආ) මහෙස්ත්‍රාත්වරයා විසින්, වගඋත්තරකරු වෙත භාරදෙනු ලබන ආඥාවක් මගින් ඒ ආඥාවේ සඳහන් කරනු ලබන යම් කාලයක් ඇතුළත පහත දැක්වෙන විස්තර ඇතුළත් ප්‍රකාශයක් අධිකරණය වෙත සපයන ලෙස ද ඔහුට නියම කරනු ලැබිය හැකි ය :–

(i) ඔහුගේ සේවායෝජකගේ හෝ ඔහුට එක් සේවායෝජකයකුට වඩා සිටීනම් ඒ සේවායෝජකයන්ගේ නම් සහ ලිපින ;

(ii) තම දැනීමට අනුව, අඩුකිරීම් ද ඇතුළුව, ඔහුගේ වැටුප පිළිබඳ විස්තර ; සහ

(iii) ඔහු හඳුනා ගැනීමට ඔහුගේ සේවායෝජකට හෝ සේවායෝජකයන්ට හැකිවීම සඳහා නියමිත හෝ අවශ්‍ය වෙනත් යම් විස්තර.

(3) මේ වගන්තිය (2) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ කරන ලද ආඥාවකට අනුකූලව සපයන ලද ප්‍රකාශයක් යම් අධිකරණයක නීති කෘත්‍යවල දී, සාක්ෂි වශයෙන් පිළිගනු ලැබිය යුතු අතර, ඊට පටහැනි තත්ත්වය ඔප්පු කරනු ලැබුවහොත් මිස, එය එකී ඡේදයේ සඳහන් විස්තර පිළිබඳව බැලූ බැල්මට පිළිගත හැකි සාක්ෂියක් වන්නේ ය.

(4) ප්‍රශ්නයට අදාළ නඩත්තු ආඥාවට අනුකූලව යම් ගෙවීමක් කිරීමට වගඋත්තරකරු අපොහොසත් වීම, ඔහු එය ඕනෑකමින්ම ප්‍රතික්ෂේප කිරීමක් හෝ ඔහුගේ සාපරාධී නොසැලකිල්ල හෝ නිසා සිදුවූවක් නොවන බව තමාට පෙනීයන්නේ නම්, මහෙස්ත්‍රාත්වරයා විසින් වැටුප තහනම් කිරීමේ ආඥාවක් කරනු නොලැබිය යුතු ය.

(5) මේ වගන්තිය (1) වන උපවගන්තිය ප්‍රකාර වගඋත්තරකරුගේ වැටුපෙන් කැපිය යුතු මුදල් ප්‍රමාණය නිශ්චය කිරීමේ දී, මහෙස්ත්‍රාත්වරයා විසින්, වගඋත්තරකරුගේ සම්පත් හා අවශ්‍යතා සහ නඩත්තු ගෙවීම පැහැර හරින ලද්දේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තාගේ අවශ්‍යතා ද සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

(6) වැටුප් තහනම් කිරීමේ ආඥාවක් යොමු කරන ලද්දේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තා වෙත ආඥාවේ පිටපතක් භාරදුන් දින පටන් දින දාහතරක් ඉකුත්වන තුරු, එය බලාත්මක නොවන්නේ ය.

(7) වැටුප් තහනම් කිරීමේ ආඥාවක්, වගඋත්තරකරුගේ හෝ නඩත්තු ආඥාව යටතේ ගෙවීම් ලැබීමට හිමිකම ඇත්තා වූ තැනැත්තාගේ හෝ ඉල්ලීම පිට ඉවත් කරනු ලැබිය හැකි ය, නැතහොත් වෙනස් කරනු ලැබිය හැකි ය.

(8) වැටුප් තහනම් කිරීමේ ආඥාවක් යොමු කරන ලද්දේ යම් තැනැත්තකු වෙත ද, ඒ තැනැත්තා විසින්,මේ පනතේ විධිවිධානවලට යටත්ව, ඒ ආඥාවට අනුකූලව හෝ (7) වන උපවගන්තිය යටතේ ආඥාව තදනන්තරව වෙනස් කරනු ලැබුවේ නම්, වෙනස් කරන ලද ආඥාවට අනුකූලව හෝ, කටයුතු කරනු ලැබිය යුතු ය.

(9) වැටුප තහනම් කිරීමේ ආඥාවකට අනුව වගඋත්තරකරුවකුගේ වැටුපෙන් අඩුකිරීම් කිසිවක් කරනු ලැබිය යුතු යම් විටක දී මේ පනත හෝ වෙනත් ලිඛිත නීතියක් හෝ යටතේ ඒ වැටුපට අදාළව වැටුප් තහනම් කිරීමේ ආඥා දෙකක් හෝ වැඩි ගණනක් බලාත්මකව පවතින අවස්ථාවක, මේ වගන්තියට අනුකූලව ක්‍රියා කිරීමේ කාර්ය සඳහා සේවායෝජකයකු විසින්, වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද, මේ පනත යටතේ කරන ලද ආඥාවක් ප්‍රථමයෙන් ක්‍රියාත්මක කර, පසුව වගඋත්තරකරුගේ වැටුපේ ඉතිරිය සම්බන්ධයෙන් වූ වෙනත් යම් ආඥා පිළිබඳව, ඒවා බලාත්මක වූ ඒ ඒ දිනවලට අනුව, කටයුතු කරනු ලැබිය යුතු ය.

(10) වැටුප තහනම් කිරීමේ ආඥාවක් අනුව යම් ගෙවීමක් කරන සේවායෝජකයකු විසින්, ඒ ආඥාව අනුව වගඋත්තරකරුගේ වැටුපෙන් අඩුකරන ලද මුදල නිශ්චිතව සඳහන් කරමින් ලියවිල්ලකින් වූ ප්‍රකාශයක් වහාම ඔහු වෙත දෙනු ලැබිය යුතු ය.

(11) වැටුප් තහනම් කිරීමේ ආඥාවකට අනුකූලව කටයුතු කිරීම පැහැර හරින හෝ නොසලකා හරින යම් සේවායෝජකයකු මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්සීයයකට නොවැඩි දඩයකට සහ වැටුප් තහනම් කිරීමේ එම ආඥාව සම්බන්ධයෙන් ම දෙවනුව හෝ තදනන්තරව වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට ද ඒ සේවායෝජක යටත් වන්නේ ය :

එසේ වුවද, වැටුප් තහනම් කිරීමේ ආඥාවකට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හැරීමේ හෝ නොසලකා හැරීමේ චෝදනාවකට ලක් වූ සේවායෝජකයකුට, තමා විසින් ඒ ආඥාවට අනුකූලව ක්‍රියා කිරීම සඳහා සියලු යුක්ති සහගත පියවර ගනු ලැබී යයි ඔප්පු කිරීම විත්ති වාචකයක් වන්නේ ය.

(12) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ වගන්තියේ විධිවිධාන මේ පනත යටතේ මහෙස්ත්‍රාත්වරයකු විසින් කරනු ලැබිය හැකි වැටුප් තහනම් කිරීමේ ආඥාවක් සම්බන්ධයෙන් බලපැවැත්විය යුතු ය.

(13) මේ වගන්තියේ කාර්ය සඳහා–

(අ) වගඋත්තරකරු රජයේ නිලධරයකු හෝ පළාත් රාජ්‍ය සේවයේ නිලධරයකු හෝ වන අවස්ථාවක, තත් කාලයේ ඔහු අනුයුක්ත කර ඇති දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ඔහුගේ සේවායෝජක වශයෙන් සලකනු ලැබිය යුතු ය ;

(ආ) වගඋත්තරකරු පළාත් පාලන සේවයේ සාමාජිකයකු වී, යම් පළාත් පාලන ආයතනයක සේවයේ නියුක්තවන අවස්ථාවක එය අවස්ථාවෝචිත පරිදි මහ නගර සභාවක් නම් කොමසාරිස්වරයා ද, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් නම් එහි සභාපතිවරයා ද, ඔහුගේ සේවායෝජක වශයෙන් සලකනු ලැබිය යුතු ය ;

(ඇ) වගඋත්තරකරු යම් සංස්ථාවක. ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ සමාගමක සේවයෙහි නියුක්තව ඇති තැනැත්තකු වන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඒ සංස්ථාවේ, ව්‍යවස්ථාපිත මණ්ඩලයේ හෝ සමාගමේ ප්‍රධාන නිලධරයා ඔහුගේ සේවායෝජක වශයෙන් සලකනු ලැබිය යුතු ය ;

(ඇ) වගඋත්තරකරු යම් හවුල් ව්‍යාපාරයක සේවයෙහි නියුක්ත තැනැත්තකු වන අවස්ථාවක, ඒ හවුල් ව්‍යාපාරයේ කළමනාකරණ හවුල්කරු හෝ කළමනාකරු ඔහුගේ සේවායෝජක වශයෙන් සලකනු ලැබිය යුතු ය ; තවද ,

(ඉ) වගඋත්තරකරු සන්නද්ධ හමුදාවල සාමාජිකයකු වන අවස්ථාවක දී, ඔහු අනුයුක්තව ඇති ඒකකයේ අණ දෙන නිලධරයා ඔහුගේ සේවායෝජක වශයෙන් සලකනු ලැබිය යුතු ය.

තැපැල් කාර්යාලය හෝ බැංකුව මාර්ගයෙන් නඩත්තු ගෙවීම.

**7**. (1) මේ පනතේ විධිවිධාන යටතේ නඩත්තු ගෙවීම සඳහා ආඥාවක් කර ඇති අවස්ථාවක, ඒ ආඥාව යටතේ අයවීමට ඇති ගෙවිය යුතු මුදල, ඒ ගෙවීමට හිමිකම් ලබන තැනැත්තාගේ නමට ඒ ආඥාවේ නිශ්චිතව සඳහන් කරනු ලබන යම් දිනයක හෝ එදිනට පෙර, ඒ ආඥාවේ නිශ්චිතව සඳහන් කරනු ලබන යම් තැපැල් කාර්යාලයක හෝ බැංකුවක එක් එක් මාසයේ දී තැන්පත් කළ යුතු යයි මහෙස්ත්‍රාත්වරයා විසින් වගඋත්තරකරුට විධාන කරනු ලැබිය හැකි අතර, එසේ තැන්පත් කරන ලද මුදල ඒ තැනැත්තා විසින් ඒ තැපැල් කාර්යාලයෙන් හෝ බැංකුවෙන් හෝ ලබාගත හැකිය. ඒ මුදල ලබාගැනීම සඳහා ඉල්ලීමක් කරනු ලැබූ විට, ඊට හිමිකම් ලබන තැනැත්තා වෙත ඒ මුදල ගෙවීම තත් කාලයේ සේවයේ යෙදී සිටින තැපැල් කාර්යාලයේ හෝ බැංකුවේ කාර්ය භාර නිලධරයාගේ කාර්යය විය යුතු ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ විධානයක් කරනු ලැබ ඇත්තා වූ සහ ඒ විධානයේ නිශ්චිතව සඳහන් ගෙවීම් තැන්පත් කිරීමේ දී පැහැර හැරීමක් කරනු ලැබ ඇත්තා වූ අවස්ථාවක, ගෙවීම ලැබීමට හිමිකම ඇති තැනැත්තා විසින්, ඒ පැහැර හැරීම පිළිබඳව අධිකරණය වෙත වාර්තා කරනු ලැබිය හැකි අතර, එවැනි අවස්ථාවක දී මහෙස්ත්‍රාත්වරයා විසින්, ඒ පැහැර හැරීම පිළිබඳව ක්‍රියා නොකළ යුත්තේ මන්දැයි හේතු දක්වන ලෙස වගඋත්තරකරු වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය. තවද, නිසි පරීක්ෂණයකින් පසුව යම් පැහැර හැරීමක් කරනු ලැබ ඇතැයි සෑහීමට පත්වුවහොත්, ඒ පැහැර හැරීම සම්බන්ධයෙන් මේ පනතින් විධිවිධාන සලස්වා ඇති පරිදි යම් දඬුවමක් නියම කරනු ලැබිය හැකි ය.

ආඥාව අවලංගු කිරීම හෝ දීමනා මුදල වෙනස් කිරීම හෝ සඳහා වූ ඉල්ලීම.

**8**. මේ පනතේ විධිවිධාන යටතේ මාසික දීමනාවක් ලබන්නා වූ හෝ ගෙවීමට ආඥා කරනු ලැබ ඇත්තා වූ හෝ යම් තැනැත්තකුගේ ඉල්ලීම මත සහ මේ පනත යටතේ නඩත්තු සඳහා වූ ආඥාවක් කරන ලද්දේ යම් තැනැත්තකුගේ ප්‍රයෝජනය සඳහා ද නැතහොත් ඔහුට එරෙහිව ද ඒ තැනැත්තා මුහුණ දුන් අවස්ථානුගත කරුණු පිළිබඳ වෙනසක් ඇති බව ඔප්පු කරනු ලැබූ විට, මහෙස්ත්‍රාත්වරයා විසින් සුදුසු යයි සලකනු ලබන පරිදි ඒ ආඥාව අවලංගු කිරීම හෝ ඒ ආඥාවේ සඳහන් දීමනාව වෙනස් කිරීම හෝ කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද, වාර්තා කරනු ලැබිය යුතු මනා හේතු මත මහෙස්ත්‍රාත්වරයා විසින් අන්‍යාකාරයකින් ආඥා කරනු ලබන්නේ නම් මිස, අවලංගු කිරීම හෝ වෙනස් කිරීම හෝ සඳහා වූ ඉල්ලීම ඒ අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද දින සිට ඒ අවලංගු කිරීම හෝ වෙනස් කිරීම හෝ බලාත්මක විය යුතු ය.

ආඥාවේ පිටපත පාර්ශවකරුට භාර දිය යුතු බව සහ ආඥාව ක්‍රියාවේ යෙදවිය යුත්තේ කෙබඳු ස්ථානයක දී ද යන බව.

**9**. මහෙස්ත්‍රාත්වරයාගේ අත්සන යටතේ සහතික කරන ලද නඩත්තු ආඥාවේ පිටපතක්, එම ආඥාව කරන ලද්දේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද, ඒ තැනැත්තා වෙත හෝ ඔහුගේ හෝ ඇගේ භාරකාරයා වෙත හෝ එම තැනැත්තාගේ සැබෑ භාරකාරත්වය ඇත්තා වූ තැනැත්තකු ඇතොත් ඔහු වෙත හෝ, දීමනාව ගෙවිය යුත්තේ යම් තැනැත්තකු වෙත ද ඒ තැනැත්තා වෙත හෝ ගෙවීමකින් තොරව භාර දිය යුතු අතර, යම් ආඥාවක් කරන අධිකරණයක් වෙත හෝ, එවැනි යම් තැනැත්තකු හෝ වගඋත්තරකරුවකු හෝ පදිංචි ස්ථානය විෂයයෙහි අධිකරණ බලය ඇත්තා වූ යම් මහෙස්ත්‍රාත්වරයකු විසින් එම ආඥාව ඉදිරිපත් කරනු ලැබූ විට සහ පාර්ශවකරුවන්ගේ අනන්‍යතාව හා අයවිය යුතු දීමනාව නොගෙවීම පිළිබඳව සෑහීමකට පත් වූ විට, 5 වන වගන්තිය හෝ 6 වන වගන්තිය හෝ යටතේ කටයුතු කරගෙන යා යුතු ය.

ඉල්ලීම ලියවිල්ලකින් විය යුතු බව සහ සිතාසිය මුද්දර ගාස්තුවෙන් නිදහස් විය යුතු බව.

**10**. නඩත්තු ආඥාවක් සම්බන්ධයෙන් වූ හෝ එබඳු ආඥාවක් ක්‍රියාවෙහි යෙදවීම සඳහා වූ හෝ සෑම ඉල්ලීමක් ම ලියවිල්ලකින් විය යුතු අතර, ඉල්ලුම්කරු විසින් හෝ ඉල්ලුම්කරු වෙනුවෙන් ඉල්ලීම කරන තැනැත්තා විසින් එය අත්සන් කරනු ලැබිය යුතු ය. තවද, එය මුද්දර ගාස්තුවෙන් නිදහස් විය යුතු ය. වගඋත්තරකරුවකු හෝ සාක්ෂිකරුවකු වෙත යවනු ලබන සෑම සිතාසියක්ම මුද්දර ගාස්තුවෙන් නිදහස් විය යුතු ය.

පරීක්ෂණය ආරම්භ කිරීම.

**11**. (1) නඩත්තු ආඥාවක් සම්බන්ධයෙන් වූ හෝ එබඳු ආඥාවක් ක්‍රියාවෙහි යෙදවීම සඳහා වූ හෝ සෑම ඉල්ලීමක් ම, ඒ ඉල්ලීම සනාථ කිරීමේ කරුණු ප්‍රකාශ කෙරෙන දිවුරුම් ප්‍රකාශයක් මගින් සනාථ කරනු ලැබිය යුතු අතර, දිවුරුම් ප්‍රකාශයේ දක්වනු ලැබ ඇති කරුණු ප්‍රමාණවත් යයි මහෙස්ත්‍රාත්වරයා සෑහීමට පත්වේ නම්, ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන ලද්දේ යම් තැනැත්තකුට එරෙහිව ද, ඒ තැනැත්තා පෙනී සිට ඒ ඉල්ලීම ප්‍රදානය නොකළ යුත්තේ මන්දැයි හේතු දක්වන ලෙස ඒ දිවුරුම් ප්‍රකාශයේ පිටපතක් සමග සිතාසියක් ඒ තැනැත්තා වෙත මහෙස්ත්‍රාත්වරයා විසින් නිකුත් කරනු ලැබිය යුතු ය :

එසේ වුවද, මාසික දීමනාවක් ගෙවීම සඳහා වූ අතුරු ආඥාවක්, මහෙස්ත්‍රාත්වරයා විසින්, සිය අභිමතය පරිදි, යම් අවස්ථාවක දී කරනු ලැබිය හැකි අතර, ඒ අතුරු ආඥාව, කලින් වෙනස් කරනු ලැබුවහොත් හෝ ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබුවහොත් හෝ මිස, ඒ ඉල්ලීම සම්බන්ධයෙන් ආඥාවක් කරනු ලබන තෙක් ක්‍රියාත්මකව පැවතිය යුතු ය ; තවද, ඒ ඉල්ලීම ඉදිරිපත් කරන ලද දින සිට හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් නියම කරනු ලබන යම් පසු දිනයක සිට, ඒ අතුරු ආඥාව බලාත්මක විය යුතු ය.

(2) අවශ්‍ය යයි තමා සලකන යම් පරීක්ෂණයකින් පසුව, ඉල්ලීමට අවසර දෙමින් හෝ එය ප්‍රතික්ෂේප කරමින් මහෙස්ත්‍රාත්වරයා විසින් ආඥාවක් කළ යුතු අතර, අවශ්‍ය වේ නම්, 5 වන වගන්තිය හෝ 6 වන වගන්තිය හෝ යටතේ ආඥාවක් කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද, මේ පනත යටතේ වූ ඉල්ලීමක හෝ මේ වගන්තියේ (1) වන උපවගන්තිය ප්‍රකාර ගොනුකිරීමට නියමිත දිවුරුම් ප්‍රකාශයක හෝ ඒ යටතේ නිකුත් කරන ලද සිතාසියක හෝ මේ පනත යටතේ පැවැත්වෙන යම් පරීක්ෂණයකට පෙර වුව ද ඒ අතරතුරදී වුව ද වෙනත් යම් නීති කෘත්‍යවල හෝ සිදු වී ඇති යම් දෝෂයක්, නොකර හැරීමක් හෝ අක්‍රමිකතාවක් හේතුකොට ගෙන, ඒ දෝෂයෙන් නොකර හැරීමෙන් හෝ අක්‍රමිකතාවෙන් පාර්ශවකරුවෙකුට වැදගත් අගතියක් සිදු වී ඇත්නම් මිස, මේ පනත යටතේ වූ ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරනු නොලැබිය යුතු ය.

වගඋත්තරකරු හා සාක්ෂිකරුවන් පැමිණ සිටීම.

**12**. (1) ඉල්ලීම කරන ලද්දේ යම් තැනැත්තකුට එරෙහිව ද ඒ තැනැත්තා ද ඉල්ලුම්කරු විසින් හෝ ඉල්ලීම කරන ලද්දේ යම් තැනැත්තකුට එරෙහිවද ඒ තැනැත්තා විසින් හෝ මහෙස්ත්‍රාත්වරයා

විසින් හෝ සාක්ෂි දීම සඳහා නියම කරනු ලබන යම් තැනැත්තකු ද පැමිණ සිටිය යුතු බවට සහ විභාගයේ කාර්ය සඳහා අවශ්‍ය යම් ලේඛනයක් ඉදිරිපත් කළ යුතු බවට බල කිරීම සඳහා 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ V වන සහ VI වන පරිච්ඡේදවලින් විධිවිධාන සලස්වා ඇති ආකාරයට මහෙස්ත්‍රාත්වරයා විසින් කටයුතු කරගෙන යා හැකි ය.

වගඋත්තරකරු නොපැමිණි විටෙක නීති කෘත්‍යය.

(2) ඉල්ලීම කරන ලද්දේ යම් තැනැත්තකුට එරෙහිව ද ඒ තැනැත්තා නොපැමිණි විටෙක, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 192 වන වගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

නීති කෘත්‍ය පැවැත්විය යුතු ආකාරය.

**13**. 12 වන වගන්තියේ (2) වන උපවගන්තියට යටත්ව, මේ පනත යටතේ මහෙස්ත්‍රාත්වරයකු විසින් ගනු ලබන සියලු සාක්ෂි, ඉල්ලීම කරන ලද්දේ යම් තැනැත්තකුට එරෙහිව ද ඒ තැනැත්තා ඉදිරිපිට දී නැතහොත් ඔහු පෞද්ගලිකව පෙනී සිටීම මහෙස්ත්‍රාත්වරයාට අවශ්‍ය නොවන විටෙක, ඔහුගේ නීතිඥවරයා ඇතොත්, ඔහු ඉදිරිපිට දී ගනු ලැබිය යුතු අතර, මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු විභාගවල දී නියම කොට ඇති ආකාරයට, ඒවා වාර්තා කරනු ලැබිය යුතු ය :

එසේ වුව ද ඉල්ලීම කරන ලද්දේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තාට විරුද්ධව 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ නියමිත ආකාරයට චෝදනාවක් ඉදිරිපත් කිරීම හෝ ඒ තැනැත්තාගේ ප්‍රකාශය වාර්තා කිරීම හෝ අවශ්‍ය නොවන්නේ ය :

එසේම තවදුරටත්, මේ පනත යටතේ වූ නීති කෘත්‍ය කිසිවක දී, ඉල්ලීම් කරන ලද්දේ යම් තැනැත්තකුට එරෙහිව ද ඒ තැනැත්තා විසින් සාමාන්‍ය සාක්ෂිකරුවකු වශයෙන් දිවුරුම් පිට හෝ ප්‍රතිඥා පිට හෝ සාක්ෂි දීම ප්‍රමාණවත් වන අතර, එක් එක් කලත්‍රයා අනෙක් කලත්‍රයාට එරෙහිව ප්‍රමාණවත් සාක්ෂිකරුවකු වන්නේ ය.

අභියාචන කිරීමේ අයිතිය.

**14**. (1) 2 වන වගන්තිය හෝ 11වන වගන්තිය හෝ යටතේ මහෙස්ත්‍රාත්වරයකු විසින් කරන ලද යම් ආඥාවකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, එම ආඥාව අපරාධ නඩුවක දී හෝ කරුණක දී මහෙස්ත්‍රාත් අධිකරණය විසින්

ප්‍රකාශයට පත් කරන ලද අවසාන ආඥාවක් වූවාක් මෙන් සලකා, ඒ හා සමාන ආකාරයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද අදාළ පළාත්බද මහාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 320 වන වගන්තියේ සිට 330 වන වගන්තිය දක්වා වූ වගන්ති (ඒ වගන්ති දෙකම ඇතුළුව) සහ 357 වන සහ 358 වන වගන්ති, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ අභියාචනයට අදාළ වන්නේ ය :

එසේ වුව ද, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 323 වන වගන්තියේ පටහැනිව කුමක් සඳහන් වුව ද, 2 වන වගන්තිය යටතේ වූ එම ආඥාව, වාර්තා කළ යුතු මනා හේතූන් මත පළාත් බද මහාධිකරණය විසින් අන්‍යාකාර විධානයක් කරනු ලබන්නේ නම් මිස, එම අභියාචනය ඉදිරිපත් කිරීමේ හේතුව නිසා නතර කරනු නොලැබිය යුතු ය :

එසේම තවදුරටත්, මහෙස්ත්‍රාත්වරයා විසින් පළාත් බද මහාධිකරණය වෙත වාර්තාව ඉදිරිපත් කරනු ලැබීමේ දී ක්‍රියාවේ යෙදවීමේ කාර්ය සඳහා තම ආඥාවේ පිටපතක් තමා වෙත රඳවාගත යුතු ය.

(2) මහාධිකරණයක් විසින් මේ වගන්තිය යටතේ එහි අභියාචන අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේදී කරනු ලැබූ ආඥාවකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, මහාධිකරණයේ අවසරය ඇතිව, සහ එසේ අවසර දීම ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවක, ශ්‍රේෂ්ඨාධිකරණයේ විශේෂ අවසරය පළමුව ඇතිව හා ලබා ගෙන නීතිය පිළිබඳ ප්‍රශ්නයක් මත ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඒ ආඥාවට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

ආකෘති.

**15**. මේ පනතේ උපලේඛනයේ සඳහන් ආකෘති, අවස්ථානුගත කරුණු අනුව අවශ්‍ය විය හැකි වෙනස් කිරීම් සහිතව, ඒ ආකෘති පත්‍රවල සඳහන් ඒ ඒ කාර්ය සඳහා පාවිච්චි කරනු ලැබිය යුතු ය.

නඩු ගාස්තු.

**16**. මේ පනත යටතේ යම් ඉල්ලීමක් හෝ අභියාචනයක් හෝ සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී, අවස්ථාවෝචිත පරිදි, ඒ ඉල්ලීම පිළිබඳ හෝ ඒ ඉල්ලීම සහ අභියාචනය පිළිබඳ හෝ නඩු ගාස්තු සියල්ල හෝ ඉන් යම් කොටසක් හෝ ගෙවන ලෙස පාර්ශවකරුවන්ගෙන් කවර හෝ පාර්ශවකරුවකුට අධිකරණය

විසින් ආඥා කරනු ලැබිය හැකි අතර, එවැනි ආඥාවක් යටතේ අයවීමට ඇති මුදල, එය දඩයක් වූවාක් මෙන් අය කර ගනු ලැබිය යුතු ය. ඒ මුදල ගෙවීම පැහැර හරිනු ලැබුවහොත් එක් මාසයක් නොඉක්මවන කාලයකට බරපතල වැඩ නැතිව බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් නියම කරනු ලැබිය හැකි ය.

වෙනත් නඩු පැවරීම් වළක්වා නොමැති බව.

**17**. ළමයකු, වියපත් දරුවකු, ආබාධිත දරුවකු, කලත්‍රයකු හෝ මව්පිය කිසිවකු ඇතුළුව යම් තැනැත්තකුට, නඩත්තු සඳහා වූ සිවිල් නඩුවක් පවත්වා ගෙන යාමට අයිතිවාසිකමක් ඇත්නම්, ඔවුන්ට ඒ අයිතිවාසිකම් අහිමිවන්නේ යයි මේ පනතෙහි ඇතුළත් කිසිවක් කියවා තේරුම් ගනු නොලැබිය යුතු ය.

56 වන අධිකාරය සංශෝධනය කිරීම.

**18**. විවාහක ස්ත්‍රීන්ගේ දේපළ ආඥාපනතේ 26 වන වගන්තිය හා 27 වන වගන්තිය ඉවත් කිරීමෙන් ඒ ආඥාපනත මෙයින් සංශෝධනය කරනු ලැබේ.

91 වන අධිකාරය සංශෝධනය කිරීම.

**19**. නඩත්තු ආඥාපනත මෙයින් ඉවත් කරනු ලැබේ.

අන්තර්කාලීන විධිවිධාන.

**20**. (1) නඩත්තු ආඥාපනත ඉවත් කිරීම නොතකා මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට ඉහතින් වූ දිනයෙහි විනිශ්චයට භාජනයව ඇති –

(අ) ඒ ආඥාපනත යටතේ පවරනු ලැබූ සියලු නීති කෘත්‍ය ; සහ

(ආ) ඒ ආඥාපනත යටතේ පවරනු ලැබූ ආඥාවලට එරෙහිව ඉදිරිපත් කර ඇති සියලු අභියාචන ,

ඒ ආඥාපනත ඉවත් කරනු නොලැබුවාක් මෙන් සියලු ආකාරයෙන් ම, විභාග කර අවසන් කරනු ලැබිය යුතු ය.

(2) නඩත්තු ආඥාපනත යටතේ කරනු ලැබුවා වූ ද, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට ඉහතින් වූ දිනයෙහි විනිශ්චයට භාජනයව පවතින්නා වූ ද, සෑම ආඥාවක්ම,මේ පනත යටතේ කරන ලද ආඥාවක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව, ඒ ආඥාව බලාත්මක කරනු ලැබිය හැකි ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**21**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් , එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

**22**. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි —

අර්ථ නිරූපණය.

"දරුකමට හදා ගැනීම" යන්නෙන්, ළමයකු හෝ දරුවකු සම්බන්ධයෙන් යෙදී ඇති විට,ළමුන් දරුකමට හදා ගැනීමේ ආඥාපනත යටතේ හෝ උඩරට නීතිය ප්‍රකාශය සහ සංශෝධනය ආඥාපනතේ විධිවිධාන යටතේ, දරුකමට හදාගත් ළමයකු හෝ දරුවකු අදහස් වේ ;

"වියපත් දරුවා" යන්නෙන්, විවාහයෙන් උපන් හෝ විවාහයකින් නූපන් හෝ දරුකමට හදාගත් හෝ වයස අවුරුදු දහඅටක් වූ හෝ වයස අවුරුදු දහඅටට වැඩි වූ සහ වයස අවුරුදු විසිපහට අඩු වූ දරුවෙක් අදහස් වේ ;

"ළමයා" යන්නෙන්, විවාහයෙන් උපන් හෝ විවාහයකින් නූපන් හෝ දරුකමට හදාගත් හෝ වයස අවුරුදු දහඅටට නොඑළඹුනා වූ දරුවෙක් අදහස් වේ ;

"ආබාධිත දරුවා" යන්නෙන්, යම් දරුවකුට ජීවිකාවක් කරගැනීමට හෝ ඔහුට හෝ ඇයට ප්‍රමාණවත් ලෙස යැපීමට හෝ නොහැකි වන පරිදි ශාරීරික හෝ මානසික වශයෙන් ආබාධිත තත්තවයකට පත්ව ඇත්තාවූ හෝ එසේ පත්වන්නා වූ හෝ විවාහයකින් උපන් නැතහොත් විවාහයකින් නූපන් නැතහොත් දරුකමට හදාගත්, කවර වූ හෝ වයසක දරුවෙක් අදහස් වේ. ;

"විවාහයෙන් උපන්" යන්න, ළමයකු හෝ දරුවකු සම්බන්ධයෙන් යෙදී ඇති විට විවාහ වූ මව්පියන්ට උපන් ළමයකු හෝ දරුවකු අදහස් වේ ;

"විවාහයකින් නූපන්" යන්න, ළමයකු හෝ දරුවකු සම්බන්ධයෙන් යෙදී ඇති විට විවාහ නොවූ මව්පියන්ට උපන් ළමයකු හෝ දරුවකු අදහස් වේ ;

" මව්පියන්" යන්නට, අනුන්ගේ දරුවෙක් දරුකමට හදාගන්නා මව්පියන් ඇතුළත් වේ. ;

"වැටුප" යන්නට, සියලු දීමනා හා වේතන ඇතුළත් වේ.

**උපලේඛනය** [15 වන වගන්තිය]

ආකෘති පත්‍ර අංක 1

1999 අංක 37 දරන නඩත්තු පනත

වගඋත්තරකරුවකු වෙත සිතාසි

..............................................................................හි...................................................................වෙත
....................................................................................වන ඔබේ කලත්‍රයා (හෝ..............................
(නම)
.......................................................................................................වන ළමයා/ වියපත් දරුවා,
(නම)
ආබාධිත දරුවා) නැතහොත්, (මවගේ නම ගෙනහැර දක්වමින් ළමයාගේ නම පවසන්න.) නඩත්තු නොකිරීමේ චෝදනාවකට උත්තර දීම සඳහා ඔබේ පැමිණීම අවශ්‍ය වන හෙයින් ද :

නැතහොත්,

..........................................................................................................සඳහා.........................................
(කාල පරිච්ඡේදය දක්වන්න.)
.................................................................................................වන ඔබේ ළමයාට/ වියපත් දරුවාට (නම සඳහන් කරන්න. නැතහොත්, ඉහත සඳහන් පරිදි විස්තර දක්වන්න.) ආබාධිත දරුවාට/කලත්‍රයාට අයවිය යුතු දීමනාව නොගෙවීමෙන් 1999 අංක 37 දරන නඩත්තු පනත යටතේ ඔබට විරුද්ධව කරන ලද නඩත්තු ආඥාවක් කඩකිරීමේ චෝදනාවකට උත්තර දීම සඳහා ඔබේ පැමිණීම අවශ්‍ය වන හෙයින් ද :

20..........................................මස.................................................වැනි දින මහෙස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ පෞද්ගලිකව (නැතහොත්, අවස්ථාවෝචිත පරිදි,නීතිඥයකු මගින්) පෙනී සිටින ලෙස ඔබට මෙයින් නියම කරනු ලැබේ. මෙය පැහැර නොහැරිය යුතු ය.

20.......................................මස.......................................වන දිනයේ දී ය.

ප්‍රධාන ලිපිකරුගේ අත්සන.

ආකෘති පත්‍ර අංක 2 [15 වන වගන්තිය]

**1999 අංක 37 දරන නඩත්තු පනත**

**නඩත්තු ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් බන්ධනාගාරගත කිරීමේ වරෙන්තුව**

.............................................................................................................පළාතේ පිස්කල් වෙත.

(නම, විස්තරය සහ ලිපිනය) විසින්, තමාටම තමා නඩත්තු කර ගැනීමට නොහැකි තත්ත්වයක සිටින්නා වූ ඔහුගේ/ඇගේ කලත්‍රයා (නම) (නැතහොත්, ඔහුගේ හෝ ඇගේ ළමයා/වියපත් දරුවා/ආබාධිත දරුවා, (නම, නැතහොත් සිතාසියෙහි දැක්වෙන පරිදි විස්තර කරන්න.) නඩත්තු කිරීම සඳහා ප්‍රමාණවත් වත්කමක් තමා සතුව ඇතැයි ද, එසේ කිරීම නොසලකා හැර (නැතහොත්, ප්‍රතික්ෂේප කරනු ලැබ) ඇතැයි ද, ආඥාව කරනු ලැබ ඇත්තේ ඔහුගේ /ඇගේ

කලත්‍රයා (නැතහොත්, ළමයා/ වියපත් දරුවා/ ආබාධිත දරුවා) නඩත්තු කිරීම සඳහා රුපියල් ..............................................................ක මාසික මුදලක් දීම එකී (නම) ට නියම කෙරෙමින් යථා පරිදි කරනු ලැබ ඇති බව ඔප්පු කරනු ලැබ ඇති හෙයින් සහ එකී (නම) විසින් එකී ආඥාව ඕනෑකමින්ම නොසලකා හැර, මාසයක (හෝ මාස)...............................................................ක දීමනා මුදල වන රුපියල් ..............................................................ක් ගෙවීම පැහැර හරිනු ලැබ ඇති හෙයින් සහ ඉක්බිතිව,..........................................................................................කාලය සඳහා බරපතල වැඩ නැතිව (හෝ ඇතිව) බන්ධනාගාරගත කිරීමට ඔහු යටත් විය යුතු යයි විනිශ්චය කෙරෙමින් වූ ආඥාවක් කරනු ලැබ ඇති හෙයින් ද :

මෙම වරෙන්තුව ද සමග එකී (නම)..................................................බන්ධනාගාරයේ දී ඔබේ භාරයට ගැනීමට එකී පිස්කල් වන ඔබට බලය දී මෙයින් නියම කරනු ලබන අතර, එකී ආඥාව නීතියට අනුව ක්‍රියාත්මක කර, එය ක්‍රියාත්මක කළ ආකාරය සහතික කෙරෙමින් වූ පිටසනක් සමග මෙම වරෙන්තුව ආපසු එවනු ලැබිය යුතු ය.

20...........................................................මස...............................................................වැනි දින වූ මෙදින මගේ අත්සන යටතේ නිකුත් කරන ලදී.

..............................

අත්සන.

ආකෘති පත්‍ර අංක **3** [15 වන වගන්තිය]

1999 අංක 37 දරන නඩත්තු පනත

**දේපළ තහනමට ගෙන විකිණීමෙන් නඩත්තු ගෙවීම බලාත්මක කිරීමේ වරෙන්තුව**

..........................................................................................................................පිස්කල් වෙත.

ස්වකීය කලත්‍රයාට (නැතහොත්, ළමයාට/ වියපත් දරුවාට/ ආබාධිත දරුවාට) ගෙවිය යුතු යයි සම්බන්ධයෙන් මාසිකව රුපියල් ........................................................ක් වූ මුදලක් ලබා දිය යුතු යයි (නම) ට නියම කෙරෙන ආඥාවක් යථා පරිදි කරනු ලැබ ඇති හෙයින් ද : එකී (නම) එකී ආඥාව ඕනෑකමින්ම නොසලකා හරිමින්, ..........................................................මාසය(හෝ මාස) සඳහා වූ දීමනාව වන රුපියල් ....................................................ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද :

...............................................................................දිස්ත්‍රික්කය ඇතුළත තිබිය හැකි, එකී (නම) ට අයත් යම් චංචල දේපළක් තහනමට ගැනීමෙන් සහ (අවසර දී ඇති දින හෝ පැය ගණන දක්වන්න.) ඇතුළත ඒ දේපළ තහනමට ගැනීමෙන් පසුවත් එකී මුදල ගෙවා නොමැති නම්, තහනමට ගත්තා වූ ඒ දේපළ හෝ එකී මුදල සපුරාලීමට ප්‍රමාණවත් වන්නා වූ ඒ දේපළින් යම් කොටසක් විකිණීමට සහ මෙම වරෙන්තුව, එය ක්‍රියාත්මක කරනු ලැබූ වහාම, ඒ යටතේ ඔබ විසින් කරන ලද්දේ සහතික කෙරෙමින් වූ පියසනක් ද සමග ආපසු එවීමට ඔබට බලය දී මෙයින් නියම කරනු ලැබේ.

20......................................................මස...............................................වැනි දින වූ මෙදින මගේ අත්සන යටතේ නිකුත් කරන ලදී.

..............................

අත්සන.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.